නමෝ බුද්ධාය

විසි වෙනි වෙළුම
ආරම්භය: 2001-07-05 | මාසික ධර්ම සංග්‍රහය අංක: 206
ශ්‍රී. බු. ව. 2561 | 2017 අගෝස්තු 07 | නිකිණි කලාපය

# කුසල විපාක

## අති පූජ්‍ය රිදියගම සුධම්මාභිවංශ නාහිමිපාණන් විසිනි

නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ///

සත්පුරුෂ පින්වතුනි, මෙහිදී බලාපොරොත්තු වන්නේ "කල්‍යාණං වා පාපකං වා තස්ස දායාදො භවිස්සාමීති" යන ධර්ම පාඨය විස්තර කිරීමට වේ. ඒ අනුව

1) යහපත් කර්ම වලට ලැබෙන යහපත් විපාක ද,
2) අයහපත් කර්ම වලට ලැබෙන අයහපත් විපාකද,

පෙන්වනු ලැබේ.

*මෙම ලිපියේ මුල් කොටස 2017 ජූලි 8 ඇසළ කලාපයට ඇතුලත් කරන ලදී.*

**මෙට්ට පිදීමේ ආනිසංස**

**සුවණ්ණ බිම්බෝහන හිමි** ට පෙර මෙට්ටයක් පිදූ පිනින් සක්විති සැපත ඇතුළු බොහෝ සැප ලැබී ඇති බව අපදාන පාලියේ 271 වන අපදානයේ සඳහන් කොට ඇත. මෙට්ට පිදීමේ හේතුවෙන් පිලින්දිවච්ඡ හිමිට ප්‍රධාන අනුසස් සයක් ලැබී ඇත්තාහ.

- සම් වූ සිරුර ඇත්තෙක් වේ
- ගරු කරන ලද්දෙක් වේ.
- මෘදු ශරීර ඇත්තෙක් වේ
- මහා දැකුම් ඇති ශරීර ඇත්තෙක් වේ
- ශයනය ලැබේ
- පරිවාර සම්පත් ලැබේ

**ඡත්‍ර දානයේ ආනිසංස**

**ඡත්‍ර දායක හිමි** පෙර ජිවිතයක තම පුතා පැවිදිව රහත්ව පිරිනිවිය. සෑය දැක වැඳ සුදු රෙදි කෑල්ලකින් සෑයට කුඩයක් කොට හැංවූ පිනින් කල්ප අනූ සතරක් සැප විපාක ලැබනු අතර, ඒ පිනින් තෙවරක් සක්විති රජ විය.

**ඒක ඡත්ත හිමි** පෙර ජිවිතයක අත්ථදස්සී බුදු හිමිට සුදු කුඩයක් දරා සිටි පිනින් කල්ප හැත්තෑ හතක් සැප ලැබී ඇත. එසේම කුසල බලයෙන් හැත්තෑ හත් වතාවක් සක් දෙව්දු වූ අතර දහස් වතාවක් සක්විති රජ විය. පිලින්දිවච්ඡ හිමියන්ට ඡත්‍ර දානයේ අනුසස් අටක් ලැබී ඇත.

- සීතලෙන් පීඩා නො ලැබේ
- තම ශරීරයෙහි කුණු නොඇලෙයි

☼ උපද්‍රව නැත්තෙක් වේ ☼ අන්‍යයන් ගේ ගෞරවයට පත් වේ
☼ ඕයුම් වූ සමක් ඇත්තෙක් වේ ☼ සිත පිරිසිදු වේ
☼ උෂ්ණයෙන් පීඩා නො ලැබේ ☼ බොහෝ විචිත්‍ර කුඩ ලැබේ

**පාත්‍ර දානයේ ආනිසංස**

**පත්තදායක** හිමි සිද්ධාර්ථ බුදු හිමිට පාත්‍රයක් පූජා කොට කල්ප අනූ හතරක් දුගතියකට නො ගිය බව සඳහන් වේ. (246 වන ආපදානය) පිළින්දිවච්ඡ හිමිට පාත්‍ර පිනින් අනුසස් දහයක් ලැබී ඇත්තාහ

☼ බොහෝ වටිනා රන් රිදී තලි ලැබේ. ☼ උපද්‍රව නැත්තෙක් වේ
☼ අනතුරු නැත්තෙක් වේ ☼ අන්‍යයන්ගේ ගෞරවයට පාත්‍ර වේ
☼ ආහාර පාන, වස්ත්‍ර, සායනාසන පහසුවෙන් ලැබේ
☼ ලැබෙන සම්පත් අකාලයේ විනාශ නොවේ
☼ ස්ථිර සිත් ඇත්තෙකු වේ ☼ හැම කල්හිම ධර්මයට කැමති වේ
☼ කෙලෙස් අඩු කෙනෙක් වේ ☼ ආශ්‍රව ද රහිත වෙත්

**දැලි පිහියා පිදීමේ අනිසංං**

☼ හැම කල්හි ම ශූරයෙක් වේ ☼ තැන්පත් සිත් ඇත්තෙකු වේ
☼ විශාරද පුද්ගලයෙකු වේ ☼ ධෛර්යවන්තයෙක් වේ
☼ වීර්යවන්තයෙක් වේ ☼ ඔසවා ගන්නා ලද සිත් ඇත්තෙක් වේ
☼ තීක්ෂණ නුවණ ලැබේ

**වාසිදායක හිමි** මිට කල්ප අනූ හතරකට පෙර පිහියක් දුන් පිනින් කල්ප අනූ හතරක් යන තුරු ම අපාගත වී නැත

**මහ පිහියා පිදීමේ ආනිසංස පහ**

☼ යහපත් සිත් ඇත්තෙකු වේ ☼ වීර්යවන්තයෙක් වේ
☼ ක්ෂාන්තිවාදී පුද්ගලයෙක් වේ ☼ මෛත්‍රිය නමැති ආයුධය ලැබේ
☼ කෙලෙස් සිඳලන අනුත්තර වූ නුවණ ලැබේ

**නිය කපන අවි පිදීමේ ආනිසංස පහ**

☼ බොහෝ දැසි දස්සන් ලැබේ ☼ ගව අශ්ව සම්පත් ලැබේ
☼ ආරක්ෂක මෙහෙකරුවන් ලැබේ ☼ කෙස් රැවුල් කපන්නන් ලැබේ
☼ බත් පිසන්නන් ලැබේ

**පවන් අතු පිදීමේ ආනිසංස අට**

☼ ශරීර දාහ නැත්තෙකු වේ ☼ මානසික දාහ නැත්තකුවේ
☼ රාග ගිනි නිවීමේ ශක්තිය ලැබේ ☼ ද්වේශ ගිනි නිවීමේ ශක්තිය ලැබේ
☼ මෝහ ගිනි නිවීමේ ශක්තිය ලැබේ ☼ මාන ගිනි නිවීමේ ශක්තිය ලැබේ
☼ මිථ්‍යාදිට්ඨි ගිනි නිවීමේ ශක්තිය ලැබේ

☼ ශීතයෙන් හා උෂ්ණයෙන් පීඩා නොලැබේ

**පෙරහන්කඩ පිදීමේ ආනිසංස පහ**

☼ දීර්ඝායුෂ ලැබේ ☼ අවි ආයුධ වලින් පීඩා නො ලබයි
☼ වස විස වලින් හිංසාවක් නො වේ ☼ අතුරු මරනයකට පත් නොවේ
☼ සොර සතුරන්ට හිංසා කල නො හැක්කෙකු වේ

**තෙල් තබා ගන්නා බඳුන් පිදීමේ ආනිසංස පහ**

☼ මනා රූ ඇත්තෙකු වේ ☼ මනා වචන ඇත්තේ වේ
☼ උසස් සිත් ඇත්තේ ද වේ ☼ අවික්ෂිප්ත සිත් ඇත්තේද වේ
☼ සකලාරක්ෂාවෙන් ආරක්ෂිත වූයේ ද වේ

චෛත්‍ය පිරිසිදු කිරීමේ ආනිසංස

**පහංකර හිමි පෙර ජීවිතයක දැව කාර්මිකයෙකු ලෙස සිටි මෙතුමා කැලේ යන විට පියුමතුර බුදු සමිඳුගේ ධාතු නිදන් කොට සාදා ඇති චෛත්‍යයෙහි කැලේ වැවී වන ගුහණයට හසුව තිබෙනවා දැක පිරිසිදු කොට අට වරක් චෛත්‍යයකට වැඳ පිටුනොපා ගිය කුසලයෙන් තව්තිසා දෙව්ලොව ඉපදුනි. මහා රන් විමනක් ද පහල වුනි. තුන්සිය වතාවක් සක් දෙවිඳු වී උපන්නේය. විසිපස් වතාවක් සක්විති රජ විය මනුලොව දී මේ විපාක ලැබුනා හ.**

☼ මහත් භෝග සම්පත් හැම විටම ලැබීම
☼ වනයට ගියේද, ඒ වනය තමාට පිහිට ලෙස පැවතීම
☼ වනයේ කණු, කටු ආදිය මාර්ගයෙන් ඉවත් වීම
☼ කුෂ්ඨ රෝගයද, ගණ්ඩ, කිලෙස, මිමැස්මොර, විතච්පිකා නම් කුෂ්ඨ රෝගය ද, දද කැසිලි ආදියද නොවීම
☼ ස්වල්ප මාත්‍රද පිළිකාවක් ශරීරයේ හට නොගැනීම
☼ රන් පැහැපත් සිරුරක් ලැබීම
☼ අකමැති දේ බැහැර වේ කැමති දෑ එළඹේ
☼ සිත එකඟ වේ. මනාව සමාධි වේ
☼ කල්ප ලක්ෂයක් තුළ දුගතියට නොවැටෙයි

*අවසානයේ ශාන්ත නිවන් සුව ලැබීමට ද මේ පින උපනිශ්‍රය වී ඇති බව 336 වන ආපදානයේ දැක්වේ*

**ඉද්කටු ගුලා පිදීමේ ආනිසංස තුන**

☼ චිත්ත සුඛය ලැබේ ☼ කායික සඛයට ලාභි වේ
☼ සැප ඉරියව් ඇත්තෙක් වේ

**අඳනකඩ පිදීමේ ආනිසංස තුන**

☼ පෙර සිත් දන්නා නුවණ ලැබේ ☼ මනා සවි ඇත්තෙක් වේ.

☼ පෙර ජීවිත සිහි කරන නුවණ ලැබේ

**පවි පිදීමේ ආනිසංස සය**

☼ සමාධින් හී කම්පා නොවේ ☼ සමාධියෙහි හුරු පුරුදු බව ඇත්තේ වේ

☼ නොබිඳෙන පිරිස් ඇත්තෙක් වේ ☼ ඇදහිය යුතු වචන ඇත්තෙක් වේ

☼ එළඹ සිටි සිහි ඇත්තෙක් වේ ☼ බය හැඟීම් ඇති නොවේ

**පාත්‍රා තබන ආධාර පිදීමේ ආනිසංස**

**පාත්‍ර ආධාර හිමි** පෙර සිඛී බුදු හිමිට පාත්‍ර ආධාරයක් පුදා සමන්තවරණ නම් සක්විති රජ විය.

ඛුජ්ජුත්තරාව මහා ධර්ම කථික උවැසියක් වුණේ ද පෙර පසේ බුදුන්ට තම අතේ දාගෙන සිටි වළලු අට ගලවා පාත්‍ර ආධාර ලෙස පිදූ පින හේතුවෙනි පාත්‍රය නො වැටී දරා සිටීමට මෙය උපකාර වුණා වගේම ඇයට ද ධර්මය දරා සිටීමේ ශක්තිය ඇති විය

**පිළින්දිවච්ඡ හිමිට පාත්‍ර ආධාර පුදා අනුසස් පහක් ලැබුණි.**

☼ කිසිවකින් කම්පා නොවන සිතක් ලැබේ

☼ මනාව සිහිය පිහිටත් ☼ ධර්මය දරා ගැනීමට නුවණ ලැබේ

☼ දරාගත් ධර්මය අමතක නො වෙත්

☼ මනාවධර්මය නිශ්චිත ලෙස වැටහෙනු ලැබේ

ඔබ සැමට සම්මා සම්බුදු සරණයි

"රත්නපාය", වැලිමඩ පාර,
බණ්ඩාරවෙල 057-2232140

මෙයට
ලක්ෂ්මන් හා ප්‍රේමචන්ද්‍ර

මිනිසාගේ පරම යුතුකම මිනිසාට සේවය කිරීමයි
ධර්මදානය පිණිස නොමිලයේ බෙදා හරින ලදී.
බරපැන සැපයීමට කැමති පිංවතුන් ඉහත ලිපිනයෙන් විමසන්න